

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 56 වන කාණ්ඩය | බු.ව. 2556 නිකිණි මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 අගෝස්තු මස 20 වන දා | 04 වන කලබ |
|---|---|---|

# බෞද්ධ ළමයා



දරුවෝ බෝසත්
නො රිද ගුරුසිත්
පුබුද බැති සිත්
බුදු මගෙහි ම යෙත්

ගුරු හිරු කිරණ වැදී
සිසු සියපත් පුබුදී
ඔහු යහ ගුණෙහි රැඳී
වොරඳති සුවඳ දිදී

- **"පියුමි"**



# දැන් රටේ සැටි

බම්බලපිටියේ වජිරාරාමාධිපති ව වැඩ විසූ
**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහා නායක**
**මාහිමිපාණන් වහන්සේ විසිනි**

අප ලක්දිව පමණක් නො ව මුළු ලෙව්හි හැම රටවල් ම දැන් අතීත කාලයෙහි පැවැති තත්ත්වයෙහි නො වේ. ශිල්ප ශාස්ත්‍රයන් අතිනුත් නා නා විධ ධනෝපාර්ජන ක්‍රමයන් අතිනුත් පිටතට පැනෙන දියුණුවක් හා කලබලයක් හැම රටවලැ ම පෙරට වඩා ඉතා උසස් වැ දැන් පැන නැඟී තිබේ. නවීන ශිල්ප ශාස්ත්‍රයහයි සලකනු ලබන නොයෙක් අළුත් සොයා ගැනීම් බෙහෙවින් යුරෝපීය රටවලත් අමෙරිකාවෙහිත් ජපන් රටෙහිත් දිනපතා දියුණු වැ ද සඵල වැ ද පැන නැඟෙන බව ලෝකවාර්තාවන්ගෙන් හැඟේ. ඇස් කන් ආදී ඉඳුරන් පිණවන නොයෙක් විසිතුරු රූප ශබ්දදී කාම වස්තුහු ද ඒ අවරදික් රටවලැ දින පතා සිය දහස් ගුණයෙන් පැනැ නැඟෙති. ශීඝ්‍රයායී වූ රථවිශේෂ ද, මොහොතකින් ඉතා දුර බැහැර සිටියවුන් ගේ ශබ්ද ශ්‍රවණයට රූප දර්ශනයට අදහස් දන ගැනීමට ඉවහල් වන යන්ත්‍ර විශේෂ ද, අති දූරස්ථ වූ ලෝක වාර්තාවන් එදිනෙද ම වාගේ දන ගැනීමට ඉවහල්වන පුවත් පත් ද සංඛ්‍යාවෙන් හා සකස්වීමෙන් දින පතා දියුණු වෙයි. සියලු කටයුතු ඉක්මනින් හා සුවපහසුවෙන් කැරැගැනීමට මාර්ගයෝ ද දිනෙන් දින සොයනු ලැබෙති.

මේ කවර අළුත් සෙවීමක වුවත් හිමියෝ අපරට වැස්සෝ නො වැ යට කී රටවලැ අය ම වෙති. එහෙත් මෙ කී නො කී සෙවීම්වලැ ප්‍රතිඵල වූ භාණ්ඩෝපකරණයෝ වෙළෙඳුන් මගින් අප රටට ද පැමිණෙති. ඒ අළුත් වූ ද අරුම වූ ද අනනුභූත පූර්ව වූ (පෙරැ පස්දෙරින් විඳැ පුරුදු නැති) ඉෂ්ටාලම්බනයන් විෂයයෙහි පෙළඹීම පෙරදිගැ වුවත් අවරදිගැ වුවත් පුහුදුන් කාගේත් සිරිතෙකි. එසේ පෙළඹුණු අය ඒ ඒ භාණ්ඩෝපකරණයන් ළංකැරැ ගැනීමට උවමනා මිල මුදල් පිළිබඳ පිපාසාවෙන් ආතුර වෙති. එසේ පිපාසාතුර වූවනට අනෙක් දේවල් විස්මෘත (නොමතක) වීම පුදුමයෙක් නො වේ.

මෙසේ දැන් මුළු ලොවැ හැම රටවල ම මිනිස්නට ඔවුන් ගේ පැරැණි කුලසිරිත් සහ ගුණ දහමුත් පරලොවත් විස්මෘත වන කාලයෙකි. අවරදික් රටවලැ මුල් කාලයෙහි ඉතා උසස් ශිෂ්ටාචාරයක් වත් පරම කෝටිප්‍රාප්ත වූ ශිල්ප ශාස්ත්‍ර විශේෂ වත් ශාන්ත වූ ආගමධර්ම වත් නො පැවැත්තේ ය. එබැවින් ඒ රටවලැ අය ආගම භක්තිය හැරැ අනෙක් කොයි අතිනුත් තව ම වැඩෙති. ඔහුන්ගේ දියුණුවෙහි ආරම්භය මෙරට මහලු පැරැකුම්බා රජු දවසැ යයි කිය හැකි ය.

එනම් - මෙරට දියුණුව පරම කෝටිප්‍රාප්ත වූ කාලයයි. එයින් පසු පිරිහෙන්නට පටන් ගත් සිංහලයෝ තව ම පිරිහෙති. ඔවුන් වෙතැ තුබූ ශිල්පශාස්ත්‍රයෝ නෂ්ටප්‍රාය වූහ. සත්‍ය ධෛර්ය ශෞර්ය වීර්යාදී මහාත්ම ගුණයෝ ක්‍රමයෙන් වැනැසී ගියහ. පරමශාන්ත ධර්මය වූ බුද්ධාගමය ඉගෙනීම හා පිළිපැදීමත් ක්‍රමයෙන් විස්මෘත විය. එහෙයින් පෙර අප රටට ම උරුම වැ පැවැති යහපත් දේවල් බෙහෙවින් ම දැන් මෙහි නැත්තේ ය. පිටරටින් ලැබුණු යහපත් වූත් අයහපත් වූත් නොයෙක් දේවල් ඇත්තේ ය.

දැන් මෙරට වැස්සෝ සාමාන්‍යයෙන් පිටතින් පැනෙන දීප්තිමත් දේවල් අනුගමනය කිරීමෙහි මුත් ආදර්ශවත් වැ

උවදෙස් දීමෙහි නුපුරුදු වෙති. නුහුරු වෙති. මෙසේ වැඩි පිරිස ආචාරභ්‍රෂ්ට වැ පරම්පරාගත කුල සිරිතින් තොර වැ ආගම් දැනීමක් හා පිළිපැදීමත් නැති වැ නා නා විධ විචිත්‍ර රසපිපාසයෙන් ආතුර වැ කල් යවයි. මෙසේ හෙයින් දැන් මේ රට ආගම භක්තිය ද, එය දැනීම හා පිළිපැදීම ද ඉතා පිරිහී තිබෙන බව ඇත්තකි. එසේ ම ''අන්‍යොන්‍ය විශ්වාසය - දයාව - ආත්මගෞරවය - ඍජුභාවය - සත්‍යය - ධර්මය- පරෝපකාරය - අප්‍රමාදය හෙවත් තමන් බැඳුණු කටයුත්තෙහි සැලැකිල්ල'' යන ආදි සිය ගණන් මහාත්මගුණයෝ මෙරට වැස්සන්ගෙන් ඉවත් වී තිබෙත්. සාහසික අපරාධයෝ දිනෙන් දින වැඩෙත්. දැන් වැඩි දෙනා '' නිදහස කුමක් ද? එය කෙසේ පරිහරණය කටයුතු ද? එය කෙබන්දනට කවරප්‍රමාණයෙකින් ලැබිය යුතුද '' යි නො දැන ම උපිළිවෙළේ නිදහස ම පතති. දරුවෝ මවුපියන්ගෙන් ද ශිෂ්‍යයෝ ගුරුවරයන්ගෙන් ද ළමා කල්හි ම නුවමනා නිදහස පතති. ස්වෛරී වැ හැසිරෙන්නට දඟලති. භාර්යාවෝ ස්වාමීවරුන්ගෙන් ද මෙහෙකරුවෝ හාම්පුතුන්ගෙන් ද එසේ ම නුවමනා නිදහස පතති. කවර අතෙකින් බැලුවත් දැන් අප රටෙහි කලබල ඇති ව්‍යර්ථ ගර්ජනා මුත් සුපරීක්ෂ්‍යකාරී ව ක්‍රියා කිරීම නො පැනේ. දැන් මේ රට පවත්නා හීන දීන තත්ත්වය බැහැර වන්නට නම් ආගමානුගත ප්‍රතිපත්තිත් දේශකාලානුරූප වූ ශිෂ්ටාචාරයත් කාලානුරූප වූ උගත්කම හා උත්සාහයත් සමගිය හා අප්‍රමාදයත් විශේෂයෙන් වුවමනා බව කියම්හ. ආගමික වූ ද ජාතික වූ ද උසස් දිනයක් වූ මේ පුර පසළොස්වක දවස්හි මේ කරුණු ගැන විවේකව සිතා බලන මෙන් සිංහල බෞද්ධ සහෝදරයන්ගෙන් ඉල්ලා සිටිමු.

**''ස්වදේශ මිත්‍රයා'' පත්‍රයට**
**1939 අප්‍රේල් මස ලියන ලද්දකි.**



# සිත පිරිසිදු කර ගැනීම

**වජිරාරාමාධිපති ව වැඩ විසූ**
**අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ විසිනි**

සිත හා රූප එක්වූ විට සත්ත්වයෙක් වේ. හුනු වැලි වතුර එක්කළ විට බදමයක් සෑදේ. තනිකර හුනුවල වත් වැලිවල වත් වතුරේ වත් ඊට උවමනා ශක්තියක් ලැබුණේ නැත. එහෙත් මේ තුන එක්වීමේ දී බදමයක් සෑදීමේ ශක්තියක් ඇති වූයේ ය.

එසේ ම සිත හා රූප යන දෙක එක්වූ විට නොයෙක් පුදුම දේ කරනට බලය ලැබේ. ඇසින් යන්ත්‍රය දෙස බලමින් ධර්මය දේශනා කරන්නේ වී නමුදු තමන්ගේ ම අදහස් හිතේ හැඟීම් පවසන හෙයින් රූපයට වඩා බලයක් හිතේ ඇති බව දැන ගන්නට පුලුවන. වචන හා ක්‍රියා දෙකට ම ප්‍රධාන සිතයි.

එක් අතෙකින් නිරය හා දෙව්ලොව පවත්නේත් අප සිතේ ම ය. සිතට දුක් කරදර ශෝක ආදී දේ ඇති වූ කල එය නිරයක් වෙයි. ප්‍රීති සුඛ ආදිය ඇති වූ කල එය දෙව්ලොවක් වෙයි. තම තමන්ගේ සිත් පිරිසිදු නම් මුළු ලොව ම පිරිසුදුයි. සිත් අපිරිසිදු නම් මුළු ලොව ම අපිරිසිදු යි.

මුහුණ දෙස බැලීමෙන් යමකුගේ අභ්‍යන්තර ප්‍රීතිය හා ශෝකය දත හැකි ය. මුහුණ ආදර්ශයක් වැනි ය. ආදර්ශය දෙස රවා බැලුවහොත් රැවූ මුහුණක් පෙනේ. සිනහයෙන් බැලුව හොත් සිනහ මුහුණක් පෙනේ. ලෝක සුඛයට ස්වකීය චිත්ත සුඛය ප්‍රධාන වේ.

ධර්ම දේශනා කරන අවස්ථාවෙහි වුව ද තද වචනයක් පාවිච්චි කළොත් තරහ මුහුණින් දේශනා කළ හොත් අසන්නා වූ සියල්ලන්ගේ මුහුණු මැළවීම් ආදී වෙනස් බවට පැමිණේ. මෛත්‍රී සහගත ව ප්‍රීතියෙන් දේශනා කළහොත් අසන්නවුන්ගේ සිත් සතුටින් ම පිරෙයි.

මේ පෘථිවි තලය මුතු මැණික් රන් රිදියෙන් ගහණ ය. එසේ ම අප සිත් ද ගුණදම් නැමැති රුවනින් ගහණ ය. පොළොව කැණ ගන්නා වටිනා ලෝහාදියෙන් ප්‍රයෝජන ගත හැක්කේ ධනවත් ස්වල්ප දෙනෙකුට ය. එහෙත් අප තුළ පවත්නා නරක යටපත් කර හොඳ හාරා මතුකර ගැනීමට පොහොසත් කමක් වුවමනා නොකෙරේ. දුප්පත් පොහොසත් කාහටත් ඇතුළත ඇති හොඳ මතුකර ගත හැකි ය. ඊට වුවමනා කරන්නේ ඉවසීම උත්සාහය ආදී උතුම් ගුණධර්ම යි. බුද්ධත්ත්වය නැමැති ශ්‍රෙෂ්ඨ භාවය පවා අපහට ලබාගත හැකි ය. බෝධි චිත්තය අප තුළ පවත්නා බැවිනි.

කුඩා බීජයක් වන නුග ඇටය මනාසේ පොහොර ආදිය ලැබීමෙන් පැළවී පසුව විශාල වෘක්ෂයක් බවට පැමිණේ. එමෙන් ම අපේ උත්සාහය ඇතොත් සත්පුරුෂාශ්‍රය ලැබෙතොත් බුද්ධත්වය පවා අත්පත්කර ගත හැකි ය. කොතරම් දුප්පතකු වුවත් උත්සාහ දරතොත් ඔහුට ද ඉහළට ම නැඟීමට බාධාවක් නැත. ඊර්ෂ්‍යා, ක්‍රෝධ, මානාදි සිත කිලුටු කරවන දේවල් නොමැති නිසා බුදුවරයන් වහන්සේ හා රහතන් වහන්සේ පිපුණු මල් වැනියහ. සිත කිලුටුවීමක් නැති නිසා හොඳ ගති මතු කරමින් නරක ගති යටපත් කර මෙලොව ම දෙව්ලොවක වසන්නාසේ ප්‍රීතිමත් ව වාසය කෙරෙති.

කුසල් රැස්කරන අපි මල්කැකුළු වැනි වෙමු. හිරු රැසින් මල් පිපේ. හෙට අනිද්දා පිපෙන මල් ඇත. ටික කලෙකින් පිපෙන මල් ඇත. අපිදු එසේ වන්නෙමු. හොඳ නරක දෙකම මනුෂ්‍යයා කෙරෙහි පවත්නා හෙයින් නරක මිනිසාය, පව්කාරයා, වරදකාරයා යයි කිසිවෙකු ඉවත දැමිය යුතු නොවේ. එබඳු අයට අනුකම්පා කළ යුතුයි.

කවර හෙයින් ද? පළමුකොට තමනුත් එබඳු තත්ත්වයක සිටි නිසා ය. තමන් උසස් වූවාක් මෙන් ඒ තැනැත්තා ද තමහටත් පෙර සමහරවිට උසස්විය හැකි ය. තමහට හොඳ කෙනෙකුන්

හමුවුවහොත් එතුමාගේ චරිතය ආදර්ශයට ගන්න. නරක කෙනකුන් දුටු විට තමන් තුළ එබඳු ගති ඇද්දැයි විමසන්න. අප කරන පින් හෝ පව් සියල්ලට ම සිත ප්‍රධාන ය. 'මනෝපුබ්බංගමා ධම්මා' යි බුදුහු වදාළහ. සිතෙහි පවත්නා බලයේ හැටියට රූපය ද, රූපයේ බලයෙන් සිත ද වෙනස් වේ.

යමකුට තරහ ඇතිවුවහොත් ඇස, කන, නැහැ, මුහුණ රතු වී විරූප වෙයි. මෛත්‍රී සිතක් ඇති වුවහොත් මුහුණ සෞම්‍ය වී චිත්තාකර්ෂණීය වෙයි. කෝපයක් ඇති වූ විට තම සිත හා ශරීරය ද දවා අවට අයගේ ද, සිත්හි ගිනි හටගනී. මෛත්‍රිය හාත්පසින් ම මීට විරුද්ධ පැත්ත ගනී.

නිදසුනක් ඃ

යශෝධරා දේවී උඩුමහලෙහි සිට මහමඟ දෙස බලන්නී කිඹුල්වත් නුවර වීථියේ වඩනා බුදු පියාණන් වහන්සේ දැක පුත් රාහුළ කුමරු ඇකයේ තබාගෙන ගාථාවන්ගෙන් බුදුගුණ වනා පුත ! අර වඩනාහු තොප පියාණෝ ය. ගොස් දැවැද්ද ඉල්ලාගනුවයි කියා පුතු මෙහෙයුවා ය. ළදරු කුමරුවා බුදුරජාණන් වහන්සේ ගේ ඇඟිල්ල අල්ලා ගනුත් ම පුරන ලද මෛත්‍රී බලයෙන් කුමරාට සැපයක් දැනී '' හාමුදුරුවනේ, ඔබ වහන්සේ ගේ සෙවණැල්ලත් මට සැප ය'' යන ආදී වශයෙන් මිහිරි වදන් බිණී ය.

මෛත්‍රී බල මහිමයෙන් තමනට පමණක් නොව අනුනට ද සැනසීම හා සැප ලබාදිය හැකි ය. සිතෙහි හටගන්නා අදහස අනුව ශරීරයෙන් ආලෝකයක් ඇති වේ. කිට්ටුව සිටින අයට ද ඒ රශ්මිය වදී. මෛත්‍රීය හෝ කෝපය වේවා දෙකම මෙසේ ම ය.

දිනක් බුදුපියාණන් වහන්සේ ඉතා ම දුර්වල වූ නැඟිට ගැනීමට පවා නොහැකි මහලු මිනිසකුට තමන් වහන්සේ ගේ මෛත්‍රී බලයෙන් ශක්තිය දී ඔහු සුවපත් කළ සේක. කවරෙක් වුවත් තම සිතට පැමිණි හැඟීම් අනුව වෙනස් වේ. සුවසේ අහර වළඳා සුවසේ සයනය කරන නීරෝගී ශක්තිමත් පුරුෂයකුට පවා යම්කිසි ශෝකජනක පණිවුඩයක් ලද කල ඇඳෙන් නැඟිට ගැනීමට බැරි තරමේ දුර්වලකමක් දැනේ.

එමෙන් දින ගණනක් අහර නොමැති ව දුර්වල වූ රෝගියකුට පවා හදිසි ප්‍රීතිමත් පණිවුඩයක් ලදහොත් නැගිටීමට වත් නොහැකි ව සිටිය හේ වහා නැගිට ක්‍රියා කෙරෙයි. සිතට ඇතිවන හැඟීම් අනුව ඔහුගේ තත්ත්වය වෙනස් වන්නේ ය. අනඳ මහතෙරුන් වහන්සේ ගේ ගිහිකල මිත්‍රයකු වූ රෝජමල්ල නම් උතුමෙක් දිනක් විහාරයට පැමිණියේ ය. ඔහු දුටු අනඳ මහ තෙරණුවෝ බුදු පියාණන් වහන්සේ දකින අටියෙන් තොප පැමිණීම ඉතාම යහපතැයි කීහ. ඒ ඇසූ රෝජමල්ල මම බුදුන් වහන්සේ දකින රිසින් නොආමි. බුදුන් දක්නට නොගියවුනට පන්සියයක් දඩයි අප අතර නියමයක් විය. ඊට භයින් පැමිණියේ මැ ය කීය. අනඳ මහ තෙරණුවෝ මේ බව බුදුපියාණන් වහන්සේට සැළකළෝ ය.

බුදුපියාණන් වහන්සේ රෝජමල්ල කෙරෙහි මෛත්‍රිය පතුරුවා කුටියට වැඩි සේක. රෝජමල්ල මෛත්‍රියෙන් පිරී සිටිතැන සිටිය නොහී බුදුපියාණන් වහන්සේ කොහි ද? කොහි ද? කියමින් වසු පැටියෙකු එළදෙන පසු පස දුවන්නාසේ කුටියක් පාසා ගොස් ගඳකිළියෙහි වැඩහුන් බුදුන් වහන්සේ දැක ධර්මය අසා සෝවාන් පෙළෙහි පිහිටියේ ය. බුදුපියාණෝ කෙක්කක් දමා අදින්නා සේ මෛත්‍රී බලයෙන් ඔහු ඇද ගත් සේක.

මෛත්‍රිය හොඳින් අවබෝධ කරගෙන තමාට තේරුම් යන අන්දමින් භාවනා කළොත් විදුලියක් මෙන් දැනෙයි. ගුවන් විදුලිය මඟින් දෙසන දහම් ද, යන්ත්‍ර උපකරණයනට කන්දී සිටින සියලු දෙනාට ම සමීපයේ සිටින්නා සේ ම ඇසේ. මෛත්‍රී සහගත පිරිසිදු සිතින් ස්ථිර අධිෂ්ඨානයෙකින් දේශනා කළ කල බලවත් අදහස් පිටවේ. සිතෙහි වූ යහපත් හැඟීම් නිසා වචනයෙන් පිටවන ධර්මය විශේෂයෙන් ම සාරවත් ය. ඒ ශ්‍රවණය කරන්නෝ ද රෝජමල්ල මෙන් මෛත්‍රියෙන් පිරී සිටින්නෝ ම ය. ස්ථිර අධිෂ්ඨානයෙකින් නික්මෙන වචනය අසන්නා සිත විනිවිද යයි. එවිට කොතරම් දුරක සිටියත් දේශනා කරන ස්වාමීන් වහන්සේ ළඟ සිටින්නාක් මෙන් දැනේ. තමන් කරා ඇද ගැනීමේ ශක්තියක් රූපයට වඩා සිතට තිබේ.

අපේ ශරීරය මෝලක් වැනි ය. මේ මෝල ක්‍රියාකිරීමට තමාගේ සිත නැමැති වතුර අවශ්‍ය ය. සිත යම් පමණ භාවිත ද එපමණට

ම බලවත් ද, ප්‍රයෝජනවත් ද වෙයි. සිත උසස් කරගත් පිරිසිදු කරගත් පමණට ඉද්ධිවිධ (නොයෙක් ආකාර සෘද්ධි) දිබ්බසෝත (දිවකන) පරචිත්ත විජානන - අනුන්ගේ සිත් දැනගැනීම, පුබ්බේ නිවාසානුස්සති - පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණ, දිබ්බචක්ඛු - දිවැස යන උතුම් නුවණ පසද ලබා ගත හැක්කේ ය.

මොහොතක් පාසා හිත වෙනස් වන්නේ ය. කරත්ත රෝදය එක තැනෙක්හි පමණක් පොළොවෙහි රඳා සිටින්නාක් මෙන් සිත ද එක මොහොතක් පමණක් පවතිමින් වෙනස් බවට පැමිණේ. මීට ''ක්ෂණ භංගුර''යි කියනු ලැබේ.

විදුලිය එළිය ඇතිව නැතිවන කාලය ඇතුළත සිත් කෝටි ගණනක් ගලා යයි. සිත උප්පාද, ඨිති, භංග යන ක්ෂණත්‍රයෙකින් යුක්තව වැල නොකැඩී නදියක් මෙන් දිගට ගලමින් පවතී. නොපෙරෙළෙන නිත්‍ය ආත්මයක් නැත. ''චිත්ත පාරිශුද්ධිය'' යනුයෙන් අදහස් කරන්නේ වෙනස් නොවන ආත්මයක් නැති දිගින් දිගට ගලා යන මේ සිත් පරම්පරාව පිරිසිදු කිරීම යි.

අප පිරිසිදුව සිටීමට නම් ශරීරය ඇඳුම් ගේ දොර පිරිසිදු විය යුතු යි. නිරෝගිව සිටීමට පිරිසිදු ආහාර, ජලය, වාතය උවමනා යි. මේවා ලැබීමට වෙහෙස විය යුතු වේ. අප දිනපතා නහා පිරිසිදු විය යුතු යි. එපමණකින් ම පිරිසිදු නොවේ. ඇඳුම් පැළඳුම් බඩුමුට්ටු ගේතුළ පිටත මිදුල ආදි සියල්ලම පිරිසිදු කළ යුතු ය. එපමණකුත් නොවේ. සුදුසු පථ්‍යදේ ආහාර වශයෙන් ගත යුතු වේ. අප උදරය අපථ්‍ය දේ පිළිගැනීමට සුදනම් නැත. රා බොන මිනිසා පළමු දිනයේ දී බොනුලැබූ සියල්ලම උදරයේ පිළිගැනීම නැති නිසා වමනය කෙරෙයි.

නැවත නැවත බී කල ද එපා යන්න හැඟවීමට වමනය ඇති වේ. පිළිකෙව් කරත් කරත් බොනු ලැබේ නම් බොක්ක නිශ්ශබ්ද වේ. ඊටපසු ශරීරය අතුනු ඥනය ආදි සියල්ලක් ම දුර්වල වී ලෙඩදුක් හා නොයෙක් විපත්ති රාශියට මුහුණ පානට සිදු වේ.



# "බෞද්ධ ළමයා" ගේ දියමන්ති උලෙළ

**(බෞද්ධ ළමයා සඟරාව ආරම්භ කොට වසර 75 ක් පිරේ)**

**බෞද්ධ ළමයා සංස්කාරක විසිනි**

බම්බලපිටියේ වජිරාරාමයෙන් පළ කරවන ලද 'බෞද්ධ ළමයා' සඟරාව පැරැණි ඉතිහාසයක් ඇති ජනප්‍රිය ළමා සඟරාවකි. බම්බලපිටියේ වජිරාරාමය පිහිටුවා වදාළ අතිපූජ්‍ය පැළැණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ ආදිකර්තෘත්වයෙන් මෙම සඟරාව ආරම්භ වූයේ 1936 වසරෙහි ය. සඟරාව දක්වන ආකාරයට 1 වන කාණ්ඩයේ 1 වන සඟරාව බුද්ධ වර්ෂ 2480 නිකිණි මස නිකුත් වී ඇත.

සඟරාවේ ආදර්ශ පාඨය වූයේ ''අභික්කම - පෙරමුණට යනු මැන'' යන්න යි. පසු කලෙක මෙය ''මා නිවත්ත අභික්කම-නො නැවත ඉදිරියට යවු'' යනුවෙන් සඳහන් කැර ඇත. එසේ ම සඟරාවේ තේමාව ලෙස යොදා ඇත්තේ ''බෝධිසත්තව චරිත නිර්මාණයෙන් ලෝක ශාන්තිය සිදු කරවන ළමා සඟරාව'' යනුවෙනි. මෙයින් ම සඟරාවේ පරමාර්ථය පැහැදිළි වේ.

ප්‍රථම සඟරාවේ පළමු වන පිටුවේ අතිපූජ්‍ය පැළැණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් විසින් ''ළමයිනට අවවාදයක්'' යන මැයෙන් ලියන ලද කුඩා ලිපිය පහත දක්වමු.

"න භජේ පාපකේ මිත්තේ - න භජේ පුරිසාධමෙ
භජේථ මිත්තෙ කල්‍යාණෙ - භජේථ පුරිසුත්තමෙ" (ධම්මපද)

ළමයිනි, යහළුවන් මෙන් ආශ්‍රයට එන පව් කරන ළමයින් ආශ්‍රය නොකරල්ලා. පහත් ක්‍රියා කරන ළමයින් ආශ්‍රය නො කරල්ලා.

තව තවත් හොඳ වන්නට කැමැති හොඳ ළමයිනි, පින් කරන යහපත් යහළුවන් ම ආශ්‍රය කරපල්ලා. උතුම් ගති ඇති උසස් පුරුෂයන් ම ආශ්‍රය කරපල්ලා.

| | |
|---|---|
| දරුවනේ බණ | අසව් |
| තෙරුවනේ සරණ | යව් |
| බණ දැනේ | පිළිපදිව් |
| දින දිනේ දියුණු | වව් |

**(බෞද්ධ ළමයා 1 කාණ්ඩය 1 කලාපය 1 පිටුව)**

පැළෑණේ මහ නා හිමියනට මෙ බඳු සඟරාවක් ආරම්භ කරන්නට අදහස පහළ වූයේ, එවක සිළුමිණ කර්තෘ මණ්ඩලයේ සේවය කොට 1936 පැවිදි දිවියට පත් වූ පඹුරන මෙත්තෙය්‍ය හිමියන් (ගිහිः චාල්ස් අබයගුණරත්න) නිසා විය හැකි ය. 'සිළුමිණ' පත්‍රයෙහි 'සීයා' නමින් පළ කැරුණු තීරු ලිපි පෙළෙහි කතුවරයා වූයේ ද අබයගුණරත්න මහතා ය. අතිපූජ්‍ය පැළෑණේ මහනා හිමියන් 'බෞද්ධ ළමයා' සඟරාව ආරම්භ කළ ද, කතුවරයා ලෙසින් ක්‍රියා කළේ මෙත්තෙය්‍ය හිමිපාණෝ ය. එහි පළමු කතුවැකියෙන් කොටසක් මෙහි සඳහන් කරන්නේ එහි සඳහන් ළමයිනට ම ගැළපෙන සරල බස් වහර වටහා ගනු සඳහා ය.

''අපි අද මේ පුංචි සඟරාව ඉතා ආදරයෙන් පුංචි දරුවා ගේ අතැ තබමු. මෙහි හැම වචනයක් ම ලියන ලද්දේ පුංචි දරුවාට ආදරයෙන් ය.

මෙය කියවන විට දරුවා ගේ හිත සතුටු වෙනවා ඇත. පිරිසිදු වෙනවා ඇත.

ඒ සතුටත් පිරිසිදු කමත් නිතර ම හිතේ තබාගත යුතු ය.

අපි ද නිතර ම දරුවාට ආදර කරමු. 'දරුවා සුවපත් වේ වා'' යි ද, ''දරුවා උගතෙක් වේවා''යි ද, දරුවා උතුමෙක් වේවා යි ද පතමු.

දරුවාට එසේ වන්නට පුළුවන. දරුවාට බුදු වන්නටත් පුළුවන පුතේ !

**(බෞද්ධ ළමයා 1 කාණ්ඩය 1 කලබ )**

අද පිරිපැසුණු වියේ පසු වන බොහෝ දෙනකු 'බෞද්ධ ළමයා' පිළිබඳ එද මතකය අවදි කරන්නේ බලවත් සතුටකිනි. බොහෝ නිවෙස්වල මෙම සඟරා එකතු කරගෙන කාණ්ඩ වශයෙන් බැඳ තබා ගැනීමේ පුරුද්දක් තිබිණි.

'බෞද්ධ ළමයා' සඟරාව ළමයින් සඳහා සැපැයුණක් වුව ද, වැඩිහිටියෝ ද එය කියැවීමට මහත් අභිරුචියක් දැක්වූහ. පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමිපාණන් සාරගර්භ ලිපි ලේඛන මෙන් ම රමණීය කුඩා කවි පන්ති ද මෙයින් ප්‍රකාශයට පත් වීම ඊට බලපෑ එක් විශේෂ හේතුවකි. තව ද කාලීන දහම විවරණ, පාළි ගාථා හා සංස්කෘත ශ්ලෝක පරිවර්තන ද, සෙසු වියතුන් ගේ දහම් ලිපි ආදියට මෙම සඟරාවෙන් නිරතුරු ව ඉඩ සලසා තිබිණි. පැළෑණේ මහනාහිමිපාණන් වහන්සේ ලියූ ලිපි ලේඛන බොහෝමයක් ම මෙම සඟරාවේ පළ කරවා තිබීම තවත් සැලකිය යුතු වැදගත් කරුණෙකි.

වසර කිහිපයක් නතර ව තිබුණු මෙම සඟරාව 1990 පොසොන් පෝද නැවත ආරම්භ කරන ලදුව, එහි පිටපතක් එවක ජනාධිපති ආර්. ප්‍රේමදස මැතිතුමාට පිළිගන්වන්නට ගිය අවස්ථාවෙහි දී එතුමා එහි කළමනාකාර හර්ෂදේව සොයිසා මහතාට සඳහන් කෙළේ අලුත් ලිපි පළ කරනවාට වඩා පැරැණි කලාප ම නැවත මුද්‍රණයෙන් එළි දක්වනවා නම් එය වැදගත් වන බව යි. තමා ළඟ එකල සඟරා බැඳ තබා ආරක්ෂා කරගෙන තිබෙන බව ද එතුමා තව දුරටත් සඳහන් කෙළේ ය.

පැළෑණේ මහනා හිමියන් හැරුණු කොට සඟරාවට සාරගර්භ ලිපි රචනා කළ අය අතර අතිපූජ්‍ය කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි, අතිපූජ්‍ය කරඳන ජිනරතන නාහිමි, අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, මහාචාර්ය ජී.පී. මලලසේකර, මාර්ටින් වික්‍රමසිංහ, අහංගම දෙ.ස. ගුණසිංහ ආදී ප්‍රකට ලේඛකයෝ ද වූහ.

එකල වජිරාරාමයේ වැඩ විසූ යතිවරුනට සිය ලේඛන කුශලතාවන් කළ එළි ගන්වා පෝෂණය කර ගැනීමට 'බෞද්ධ ළමයා' සඟරාව සරු තෝතැන්නක් වී ය. අතිපූජ්‍ය නාරද මාහිමි, කඹුරුගමුවේ මහානාම මාහිමි, දෙණිපිටියේ සුමනසිරි මාහිමි, කොග්ගල රෝහණ හිමි, මඩිහේ පඤ්ඤාසීහ මාහිමි, කපුගම සුමනවංශ මාහිමි, වැලිගම ඤාණරතන මාහිමි, පියදස්සි මාහිමි, අම්පිටියේ ශ්‍රී රාහුළ මාහිමි, පඹුරන මෙත්තෙය්‍ය හිමි, ඌරුගම්වේ සේනානන්ද හිමි, නාඹටුන්නේ ගුණසිරි හිමි ආදි වජිරාරාමවාසී ව වැඩ විසූ එවක තරුණ වියේ සිටි හිමිවරුන් ලියූ ලිපි ලේඛන නිසා ද මෙම සඟරාව කොයි කා අතරත් ජනාදරයට පත් වූ බව කිව යුතු ය. උන් වහන්සේලාට ම ආවේණික වූ සරල සුගම රචනා ආරකින් ඇති කර ගත් අනන්‍යතාවක් මේ සැම ලිපියකින් ම ප්‍රකට විය. වෙසෙසින් ම නාරද මාහිමියන් සහ පඹුරන මෙත්තෙය්‍ය හිමියන් ගේ රචනා ඒවා අතර සුවිශේෂ විය.

පැළෑණේ මහ නා හිමියන් භාවිත කළ ශාස්ත්‍රීය ගැඹුරු වියත් බස් වහර ළමා ලිපි සම්පාදනයෙහි දී වෙසෙසින් ම වෙනස් ව භාවිත කළ ආකාරයක් පෙනේ. පහත සඳහන් ළමා පැදිය ඊට උදහරණයකි.

සුමුදු සුවඳ සුළඟ හමා
පුබුදු මලෙහි බමර බමා
උදය පිබිදි බොළඳ ළමා
පිරිස දෙ ඇස පොතට යොමා

මුල සිට අගට ම පාඩම
පිළියෙළ කර ගෙන නැරම
නො වරදවා හැම වාරෙම
අකුරට යයි වඩවා පෙම

**(1 වන කාණ්ඩය 12 කලඹ)**

මෙ බඳු ගැදි පැදි රචනාවලින් පිරිපුන් බෞද්ධ ළමයා සඟරාව හැම පුනු පොහෝ දිනෙක ම නිකුත් කිරීමට බම්බලපිටියේ සිරි වජිරාරාමය කටයුතු සලසා තිබිණි. පැරැණි සඟරා නැවත පෙරළා බලන ඕනෑම කෙනකුට සැබැවින් ම ආනන්දනීය ආස්වාදයක් ජනිත කරවයි.

මුල් කාලයෙහි දී අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහ නාහිමිපාණන් ගේ අනුශාසකත්වයෙන් හා ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, ඩබ්.ඒ. ද සිල්වා, කැෂියස් ඒ පෙරෙයිරා, පඩිකාර මුහන්දිරම් ජී. ජේ. ඇස්. කුලතිලක, පී. තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන, ජී.පී. මලලසේකර යන විද්වතුන් ගේ උපදේශ මණ්ඩලයකින් ද සමන්විත ව 'බෞද්ධ ළමයා' පාලක සභාවක් පිහිටුවාගෙන තුබුණු අතර, එහි ආරක්ෂක මණ්ඩලය ලෙස මුදලි ආර්. ජේ. විජේතුංග, ජේ. එම් පෙරේරා, දෙස්තර ඒ. රත්නපාල, දෙස්තර ඩබ්. ඊ. ඇල්ප්‍රඩ් පොන්සේකා, වී. ටී. පණ්ඩිතගුණවර්ධන, පාලිත වීරමන් යන විද්වත්හු ක්‍රියා කළහ.

එසේ ම බෞද්ධ ළමයා කළමනාකරුවන් ලෙස ජේ. එස්. ගෝමස්. ඒ. ඩබ්. එදිරිසිංහ, පීටර් තුඩාවේ පණ්ඩිතගුණවර්ධන, පී. පී. කරුණාරත්න, හර්ෂ සොයිසා යන මහත්වරුන් ක්‍රියා කර ඇත. බෞද්ධ ළමයා සඟරාවේ වත්මන් කළමනාකාරතුමා වශයෙන් ක්‍රියා කරන්නේ මහේන්ද්‍ර විජේතිලක මහතා ය. වසර 25 කට ආසන්න කාලයක් මුළුල්ලේ මෙම අගනා සඟරාව එළි දක්වීම සඳහා 'සම්පත් බැංකුව' ලබා දෙන අනුග්‍රහය වෙනුවෙන් මුළු ජාතියේ ම ප්‍රශංසාව එම බැංකුවේ අතීත සහා වර්තමාන කළමනාකාරිත්වයට පිරිනැමෙනු ඒකාන්ත ය.



# ලුම්බිණි අලංකාරය

**සුනිල් සරත් පෙරේරා කිවියාණන් විසිනි**

හිම කඳු වැටියයි
සල් තුරු සෙවණයි
බුදු හිමි ඉපැදුණ - ලුම්බිණිය යි

රෑ හඳ පානයි
මහ බෝ මළුවයි
මෙත් සිහිලෙන් - නිවුණා වාගෙයි

විකසිත පියුමයි
කරුණා දහරයි
පොකුණු දියේ - හෙම්හිට නැළවෙයි

නිල්මිණි තලයයි
සුලකළ වෙහෙරයි
සඳකත් පිනිදියරෙන් නැහැවෙයි

බුදුගුණ ගීයයි
සාදු නාදයයි
මිහිරෙන් මිහිරේ - මතුවන්නේ

නෙක් නෙක් දෙවියන්
අහසින් වඩිමින්
දෙසඳුන් පුද බිම - තවරන්නේ



# මහිලාමුඛ ජාතකය

**විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය**

තුන්ලෝ තිලක වූ තථාගතයන් වහන්සේ දෙව්දත් තෙරුන් වෙනුවෙන් වේළුවනාරාමයෙහි දී මෙම ජාතක කථාව වදාළ සේක.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන කල දානය පිළියෙළ කරනුයේ අවට ජීවත් වූ දැහැමි දායකයන් විසිනි. මෙකල දෙව්දත් තෙරහු අජාසත් කුමරුන් හා මිතුරු වී ගයාහිස නම් ගමෙහි විහාරයක වාසය කළහ. දෙව්දත් තෙරුනට ඒ අවට වසන්නා වූ දැහැමි නොවන පිරිසක් දානය පූජා කළහ. ඒ දානය ඉතා රසවත් ආහාර බඳුන් පන්සීයයකින් සමන්විත විය.

මෙකල රජගහ නුවර වාසය කළ යහළුවන් දෙදෙනෙකුට මහණ වීමට සිත් පහළ විය. එක් යහළුවකු බුදුරජාණන් වහන්සේ වෙතින් මහණ දම් පිරීමට ඉටා ගති. අනෙක් යහළුවා දෙව්දත් තෙරුන් වෙතින් මහණ දම් පිරීමට සිතුවේ ය. බුදුරජාණන් වහන්සේ වෙතින් පැවිදි බව ලැබූ භික්ෂුව පිණ්ඩපාතයෙහි යෙදෙමින් දානය ලබා ගත්හ. ඒ දුටු අනෙත් මිතුරු භික්ෂුව '' ඔබ පිණ්ඩපාතයෙහි යෙදෙමින් දුක් විඳින්නේ කුමට ද? දෙව්දත් තෙරුන්ගේ විහාරස්ථානයෙහි ඇති පමණ රස ආහාර ඇත. එහි පැමිණ දන් වළඳන්නට පුළුවන් යැ''යි කී ය.

භික්ෂූන් වහන්සේ එම දානය වළඳන්නට අකමැති වූහ. පසුව මිතුරු භික්ෂුව ගේ බල කිරීම නිසා ගයාහිස විහාරයට ගොස් දානය වළඳන්නට පටන් ගත්හ. දින කිහිපයක් ගත විය. භික්ෂුව දෙව්දත්

තෙරණුවන් හට ලැබෙන දනය වළඳන්නට යන බැව් සැවොම දනගත්හ. භික්ෂූහු මේ බව බුදුරජාණන් වහන්සේ හට සැළ කළහ. '' භික්ෂුව, දෙව්දත් තෙරුනට අධර්මිෂ්ඨ මිනිසුන්ගෙන් ලැබෙන ආහාර වළඳන්නට යන්නේ කුමක් නිසාදැයි විමසූහ. පෙර කාලයෙහි ද අධාර්මික මිනිසුන්ගේ ආහාර වැළඳීමටත් ඔවුන් අනුගමනය කිරීමටත් පුරුදුව සිටි බව පවසා මෙම අතීත කථාව වදාළහ.

බරණැස් නුවර බඹදත් නම් රජු පාලනය කරන කල, බෝසතාණෝ රජුගේ ඇමතිවරයෙක් වූහ. රජුහට මහිලාමුඛ නම් මඟුල් ඇතෙක් සිටියේ ය. ඒ ඇතා සිල්වත් ආචාරශීලී අහිංසකයෙක් විය. රාත්‍රියට ඇත්ගාල අසලට එක් රැස් වන හොරු කණ්ඩායමක් ගෙහිමියන් මරා සොරකම් කරන ආකාරයත්, සාහසික ලෙස ජීවත්විය යුතු ආකාරයත් කතිකා කර ගත්හ. ඇතාට දින කීපයක් මෙලෙස මිනිසුන් සාකච්ඡා කරනු ඇසුණි. ඇතාට සැඩ පරුෂ ගති හුරු වන්නට විය. එක් දිනෙක උදැසන ඇත්ගොව්වා පැමිණි කල, මහිලාමුඛ ඇතා ඔහුට ගසා මරා දැම්මේ ය. තමන් අසලට එන මිනිසුන් මරා දැමීමට පටන්ගති. ඉතා සංසුන් ලෙස ජීවත් වූ ඇතාට කුමක් වූයේ දැයි සොයා බලන ලෙස රජතුමා බෝසතාණනට කී ය.

ඇතා පරීක්ෂා කළ බෝසතාණෝ කිසි බාහිර රෝග පීඩාවක් ඇතාට නැති බව කීහ. අනුන්ගේ නපුරු කථා අසා මෙසේ වන්නට ඇතැයි ඇත්ගොව්වෝ පැවසූහ. ඇතා යහමගට ගැනීමට කුමක් කළ යුතු දැයි බෝසතාණන්ගෙන් විමසූහ. බෝසතාණෝ සිල්වත් ගුණවත් මහලු බමුණන් ගෙන්වා යහපත් කථා අසන්නට සැලැස්වී ය. එතැන් සිට මහිලාමුඛ ඇතා මිනිසුන් මැරුවේ නැත. ශාන්ත ලෙස හැසිරුණු ඇතා කාගේත් ප්‍රශංසාවට ලක් විය.

යහපත් අය ඇසුරු කරන්නන් යහපත් වන බව අයහපත් අය ඇසුරු කරන්නන් අයහපත් වන බව බුදුරජාණන් වහන්සේ වදාළහ.

එකල මහිලාමුඛ ඇතා දේවදත්ත තෙරුන් බවත් ඇමතිතුමා තමන් වහන්සේ බවත් බුදුරජාණන් වහන්සේ වදාළහ.



# හැකියාව අවතක්සේරු නොකරන්න

**"මුතු සීයා" විසිනි**

පක්ෂියෙක් ජීවත් ව සිටින විට කුඩා කුහුඹුවන් විශාල සංඛ්‍යාවක් කා දමයි. උෟ මැරුණු විට කුහුඹුවෝ උෟ වටා රොක් වී උෟව කා දමති. වේලාව හා අවස්ථාව කොයි මොහොතේ වුව වෙනස් විය හැකි ය. අවලංගු විය හැකි ය.

එහෙයින් ජීවිතයේ කවර අවස්ථාවක දී වුව කෙනෙකු හෙළා නොදකින්න. අවතක්සේරු නොකරන්න. කිසි කෙනෙකුට නොරිදවන්න.

අද ඔබ ඉතා ම සවිමත් වූවකු විය හැකි ය. එහෙත් ඔබටත් වඩා කාලය සවිමත් බව සිහියට ගන්න.

එක ගසකින් ගිනිකූරු දසලක්ෂයක් තැනිය හැකි ය. එහෙත් ගස් දස ලක්ෂයක් පුළුස්සා වනසා දැමීමට අවශ්‍ය වනුයේ එක ම එක ගිනි කූරක් පමණි.

ජීවිතයේ දී ඔබට හමු වන හැම කෙනෙකුට ම කිසියම් අවශ්‍යතාවක් තිබෙන බව ඔබට අවබෝධ විය යුතු ය.

එකෙකු ඔබ පිරික්සනු ඇත. තවෙකකු ඔබ ව ප්‍රයෝජනයකට යොදා ගනු ඇත. තවත් සමහරකු ඔබට පාඩම් උගන්වනු ඇත.

මේ හැමට ම වඩා වැදගත් වනුයේ, ඔබ තුළින් සාරය මතු කර ගන්නා, ඔබට ගරු කරන, ඔබ කවරෙක් දැයි දැන හඳුනා ගෙන ඔබ පිළිගන්නා අයයි.

ආන්න ඒ අය යි, ඔබ වටා රඳවා ගත යුත්තේ, ඇසුරු කළ යුත්තේ.

(කෙටි කතාව)



# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

බෝසත් දුවේ පුතේ, මලක සුවඳ කෙටි කථාවෙන් ලෝකය නිර්මාණය වීමත් එහි මිනිසුන් ඇති වීමත් මා ඔබට කියා දුන්නා. අප ගියවර කලාපය තුළින් මෙලොව ජීවත් වූ මිනිසුන් එකිනෙකා කළ කී දෑ අනුව යමින් එය ම යහපත් කියල හිතල පොදුවේ හැමට ම බෙදී යෑමට තිබුණ ස්වාභාවික සම්පත් තම තමන්ට කැමති ආකාරයට ගොඩ ගසා ගැනීමට මිනිසා යොමු වූ ආකාරයත් කියා දුන්නා. අද එතැන් සිට....

දරුවා, සමිත, මිනිසුන් බොහෝ කාලයකට සුවඳැල් රැස් කරල තම තමන්ගේ නිවාසවල ගොඩ ගහගත්තා මතකයි නේද?

එහෙමයි අපෙ හාමුදුරුවනේ...

මේ අතර වාරයේ තවත් පුද්ගලයෙකුට මෙහෙම සිතිවිල්ලක් පහළ වුණා.

''දැන් හැමෝ ම වගේ සුවඳැල් රැස් කරනවා. ළඟින් ළඟින් තියෙන සුවඳැල් කරල් හැමෝ ම කපාගෙනත් එනවා. මෙහෙම ගියොත් තව ටික දවසකින් සුවඳැල් හොය හොයා බොහෝ දුර යන්න වෙනවා. එයින් තවත් වෙහෙසින් වෙහෙසට පත් වෙනවා.

දැන් ඉතින් කරන්නට තියෙන හොඳ ම දේ තමයි මටම කියල මේ මගේ කොටස සරු බිමක් වෙන් කර ගන්න එක ''

ඉතින් ඒ පුද්ගලයා මේ මගේ කොටස කියලා සරු බිමක් වෙන්කර ගත්තා. මේ වෙනස් ආකාරයක සිදුවීම දිහා බලාගෙන හිටිය අනෙක් උදවියත් ඒ අයට කැමති කැමැති ආකාරයට සුවඳැල් පිරුණු සරු බිම් වෙන් කර ගත්තා.

මේ බිම් වෙන් කරන්නට වැට කඩොලු පවා බැඳගත්තා. එතනින් නතර නොවුණු මේ උදවිය ''මරියාදව පැනවීම'' කියලා සම්මත නමකුත් මෙයට යොදා ගත්තා.

බොහෝ ශක්ති සම්පන්න මිනිසුන්ට වැඩි ඉඩකඩක් ලැබුණා. තම තමන්ට වටිනා කියන සරුබිම් බොහෝ ප්‍රමාණයක් අල්ලා ගන්නට. මේ ක්‍රියාවෙන් පිරිසකට සරසාර බිම් හිමිවීමත් තවත් පිරිසකට සරුබිම් අහිමි වීමත් සිදු වුණා.

බලන්න සමිත පුතේ, අවසානයේ සිදු වුණේ මේ ලෝකයේ ඇති නැති දෙපිරිසක් බිහිවුණ එකයි. අදත් ලෝකය පුරාම මේ විදිහට සම්පත් බෙදිලා යන කොට මේ දෙයම තමා සිදු වෙන්නෙ. බොහෝ පිරිසක් සම්පත් අධිකව පරිභෝජනය කරනවා. ඒ වගේ ම මේ ලෝකේ තව තැනක වතුර බිංදුවක්වත් නැතිව මැරිලා යන මිනිසුන් සිටින බව පුංචි ඔයාලත් මතක තියාගන්න ඕන කාරණයක්.

ඇයි මේ විදිහට ඇති නැති පරතරයක් මේ ලෝකෙ නිර්මාණය වුණේ ? පොඩි මහත්තයට කියන්න පුළුවනි ද?

ලබන කලාපයට....